සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/ கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 07 | S | I, II |
|---|---|---|

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

## 4 ශ්‍රේණිය

## (07) ඉතිහාසය - I, II

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

### ඉතිහාසය I පත්‍රය

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක 01 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.

01. අනුරාධපුර රාජධානියේ ආරම්භක පාලකයා වන්නේ,
   1. පස්වන මිහිඳු රජු ය. 2. පණ්ඩුකාභය රජු ය. 3. විජය රජු ය. 4. ඉලනාග රජු ය.

02. ඉන්දීය කුලී හමුදා ආධාරයෙන් මෙරට බලයට පත් පළමු පාලකයා වන්නේ,
   1. මුටසීව රජු ය. 2. සූරතිස්ස රජු ය. 3. දේවානම්පියතිස්ස රජු ය. 4. ඉලනාග රජු ය.

03. දකුණු ඉන්දියාව තුළ ලාංකේය පාලකයන්ගේ හිතවත් ම පිරිස වූයේ,
   1. පල්ලවයන් ය. 2. පාණ්ඩ්‍යයන් ය.
   3. චෝළයන් ය. 4. පාණ්ඩ්‍යයන් සහ චෝළයන් ය.

04. අවසන් වරට අනුරාධපුර රාජධානියේ වාරි කර්මාන්ත ඉදි කළ බවට තොරතුරු දක්නට ඇත්තේ,
   1. මහසෙන් රාජ්‍ය සමයේ ය. 2. ධාතුසේන රාජ්‍ය සමයේ ය.
   3. හතරවන මහින්ද රාජ්‍ය සමයේ ය. 4. වසභ රාජ්‍ය සමයේ ය.

05. අනුරාධපුරය විනාශ කර තම පාලන මධ්‍යස්ථානය පොලොන්නරුවට ගෙන ගොස් එයට **ජනනාථපුරම්** යන නම තබන ලද්දේ,
   1. පළමුවන රාජේන්ද්‍ර රජු ය. 2. මහා රාජ රාජ රජු ය.
   3. ශ්‍රී මාර ශ්‍රී වල්ලභ රජු ය. 4. දෙවන වරගුණ වර්මන් රජු ය.

06. පොලොන්නරු රාජධානිය පාලනය කළ ශ්‍රේෂ්ඨ පාලකයන් අතරට අයත් වන්නේ,
   1. පළමුවන පරාක්‍රමබාහු රජු ය. 2. පළමුවන සේන රජු ය.
   3. මානවම්ම රජු ය. 4. පස්වන මිහිඳු රජු ය.

07. කල්‍යාණවතී රැජින කුමන රජුගේ බිසව ද?
   1. වීරබාහු රජුගේ 2. නිශ්ශංකමල්ල රජුගේ
   3. පළමුවන පරාක්‍රමබාහු රජුගේ 4. පරාක්‍රම පාණ්ඩ්‍ය රජුගේ

08. "**කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත**" ලෙස හැඳින්වෙන්නේ කවුරුන් ද?
   1. නිශ්ශංකමල්ල රජතුමා 2. පළමුවන පරාක්‍රමබාහු රජතුමා
   3. දෙවන පරාක්‍රමබාහු රජතුමා 4. පළමුවන බුවනෙකබාහු රජතුමා

09. 15 වන සියවසයේ සිටි දේශ ගවේෂණ ව්‍යාපාරයේ පුරෝගාමියා කවුරුන් ද?
   1. වස්කෝ ද ගාමා 2. ටොලමි 3. නාවික හෙන්රි 4. ලොරෙන්සෝ ද අල්මේදා

10. පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට කෝට්ටේ පාලනය ගෙන ගිය පාලකයා කවුරුන් ද?
    1. විජයබාහු රජු  2. අටවන වීර පරාක්‍රමබාහු රජු
    3. බුවනෙකබාහු රජු  4. මායාදුන්නේ රජු

11. කෝට්ටේ දළදා මැදුරේ තැන්පත් කර තිබූ දන්ත ධාතුන් වහන්සේ සඟවා තබන ලද්දේ,
    1. දෙල්ගමුව විහාරයේ කුරහන් ගලේ ය.  2. කිතුල්පේ විහාරයේ කුරහන් ගලේ ය.
    3. වැගම විහාරයේ කුරහන් ගලේ ය.  4. බෙලිගල විහාරයේ කුරහන් ගලේ ය.

12. සීතාවක රාජසිංහ නමින් අභිෂේක ලැබුවේ කවුරුන් ද?
    1. ධර්මපාල කුමරු  2. මායාදුන්නේ කුමරු  3. බුවනෙකබා කුමරු  4. ටිකිරි කුමරු

13. ''දොන් පිලිප්'' නමින් බෞතීස්ම ලැබුවේ,
    1. කොනප්පු බණ්ඩාර ය.  2. යමසිංහ බණ්ඩාර කුමරු ය.
    3. ධර්මපාල කුමරු ය.  4. ඉහත කිසිවෙකු නොවේ.

14. ''කන්ද උඩරට ද්‍රෝහියා'' යන ආක්‍රෝශ නාමයෙන් පෘතුගීසීන් විසින් හඳුන්වන ලද්දේ,
    1. දෙවන රාජසිංහ රජු ය.  2. සෙනරත් රජු ය.
    3. පළමුවන විමලධර්මසූරිය රජු ය.  4. පළමුවන රාජසිංහ රජු ය.

15. පෘතුගීසී ජාතිකයන් නිසා ලංකාවේ ඇති වූ ලෙඩ රෝගයක් වන්නේ මින් කුමක් ද?
    1. මැලේරියාව  2. ලාදුරු  3. ඩෙංගු  4. පාචනය

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.**

16. 1. සිල්වා  2. පෙරේරා  3. කොස්තා  4. රණසිංහ

17. 1. දෝසි  2. කිරිබත්  3. පාන්  4. සලාද

18. 1. කොළඹ කොමාන්ඩරිය  2. ගාල්ල කොමාන්ඩරිය
    3. යාල කොමාන්ඩරිය  4. යාපනය කොමාන්ඩරිය

19. 1. රාද් වැන් ජස්ටිට්  2. හුෆ්ට්මන්  3. ලැන්ඩ්රාද්  4. සිවිල්රාද්

20. 1. නටරාජා ප්‍රතිමාව  2. සීයුස් ප්‍රතිමාව  3. ඇතීනා ප්‍රතිමාව  4. මයිරෝ ප්‍රතිමාව

- **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම / ප්‍රකාශන යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නාම / ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන නාම / ප්‍රකාශන යුගලය තෝරන්න.**

21. 1. ආකාශයට අධිපති - සීයුස් දෙවියා  2. බුද්ධියට අධිපති - ඇපලෝ දෙවියා
    3. ආලයට අධිපති - එරෝස් දෙවියා  4. සමුද්‍රයට අධිපති - පොසිඩන් දෙවියා

22. 1. බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා - හිපොක්‍රටීස්  2. ගණිත විද්‍යාවේ පියා - පයිතගරස්
    3. නවීන විද්‍යාවේ පියා - ප්ලේටෝ  4. තර්ක ශාස්ත්‍රයේ පියා - ඇරිස්ටෝටල්

23. 1. මාර්ස් - යුද්ධයට අධිපති දෙවියා  2. වීනස් - ආලයට අධිපති දෙවියා
    3. ජුපිටර් - අහසට අධිපති දෙවියා  4. සෙරෙස් - මව් දෙවඟන

24. 1. අංග - චම්පා  2. මල්ල - උදේනිය
    3. මත්ස - විරාට  4. කාසි - බරණැස

25. 1. ලිච්ඡවී - අල්ලකප්ප  2. ශාක්‍යයන් - කපිල වස්තු
    3. කෝලියන් - රාමගාම  4. කාලාමයන් - කේසපුත්ත

- **අංක 26 - 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරන්න.**

    (A) සහ (B) පමණක් නිවැරදි නම් අංක 1 ද,

    (B) සහ (C) පමණක් නිවැරදි නම් අංක 2 ද,

    (B) සහ (D) පමණක් නිවැරදි නම් අංක 3 ද,

    (A) සහ (D) පමණක් නිවැරදි නම් අංක 4 ද, සලකුණු කරන්න.

26. රෝම අධිරාජයේ පරිහානියට බලපෑ දේශපාලන සාධක වන්නේ,

    A. බලය විකේන්ද්‍රගත වීම.
    B. රාජධානියේ දේශ සීමා පුළුල් වීම.
    C. හමුදා විනය ගරුක වීම.
    D. රාජ්‍ය උරුමය පිළිබඳ නිරවුල් ප්‍රතිපත්ති තිබීම. (.........)

27. ද්වාරවතී ශිෂ්ටාචාරයට අදාළ සාධක වන්නේ,

    A. ථෙරවාදී බුදුදහම මෙහි ව්‍යාප්තව තිබිණි.
    B. මෙහි හමු වී ඇති ලෝහමය හිටි බුදු පිළිම ලංකාවේ පොලොන්නරු යුගයේ බුදු පිළිමවලට සමාන ය.
    C. සිංහල භික්ෂුන් වහන්සේලා තායිලන්තයට ගොස් ඇති බවට සාක්ෂි හමු වී නැත.
    D. සෙල්ලිපි සහ වංසාවතාර අනුව තායිලන්තය එකල කාම්බෝජය නමින් හඳුන්වා ඇත. (.........)

28. ලාඕසයට අදාළ සාධක වන්නේ,

    A. ලාඕසයේ වර්තමාන රාජ්‍ය ආගම වන්නේ හින්දු දහම යි.
    B. ලාඕස වැසියෝ ජාතක කතාවලට දැඩි ඇල්මක් දක්වති.
    C. එරට දස ජාතකය සහ පනස් ජාතක ලෙස ජාතක කතා පොත් දෙකක් රචනා කර ඇත.
    D. වර්තමානයේ මහායාන බුදු දහම ප්‍රචලිත කිරීමට රජය උත්සහ දරයි. (.........)

29. චීනයේ බෞද්ධ සංස්කෘතියට අදාළ සාධක වන්නේ,

    A. චීන සමාජ චින්තනය හැඩ ගැස්වීමට පදනම් වූයේ කොන්ෆියුසියස් දහම වේ.
    B. චීනයට බුදු දහම ගෙනෙන ලද්දේ විං - කී අධිරාජ්‍යයාගේ කාලයේ ය.
    C. පළමුවන සිය වසයේ දී ටාටර් වංසය බුදු දහම පැතිර වීමට සහයෝගය ලබා නොදුන්නේ ය.
    D. අධිරාජ ලියාං - වුති හට බුදුදහමට එල්ල වූ අභියෝග ජයගැනීමට නොහැකි විය. (.........)

30. ජපානයේ බෞද්ධ සංස්කෘතියට අදාළ සාධක වන්නේ,

    A. ජපානයට බුදු දහම ස්ථාවර වූයේ පස්වන සියවසේ ය.
    B. ජපන් බෞද්ධයන් විසින් ෂෝතෙකු කුමරු අවලෝකිතේශ්වර බුදුන්ගේ අවතාරයක් ලෙස හඳුන්වනු ලබයි.
    C. ජපානයේ සෝගාවරු සෙසු ගෝත්‍ර අභිබවා බලවත්ව ඇත.
    D. සෙන් බුදු සමය ජපන් ජන ජීවිතය කෙරෙහි බලපෑමක් කළේ නැත. (.........)

- අංක 31 - 36 තෙක් දක්වා ඇති නාම / ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. X තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන Y තීරුවේ නාම / ප්‍රකාශන සමග කිසියම් ආකාරයට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. X තීරුවේ ඒවා Y තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

31.

| X | Y |
|---|---|
| 1. පළමුවන විජයබාහු රජු | A. නිශ්ශංක ලතා මණ්ඩපය |
| 2. මහා පරාක්‍රමබාහු රජු | B. දඹදෙණි රාජධානිය |
| 3. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු | C. පොලොන්නරු රාජධානිය |
| 4. තුන්වන විජයබාහු රජු | D. පරාක්‍රම සමුද්‍රය |

1. A B C D  2. C A B D  3. C D A B  4. D A C B

32.

| X | Y |
|---|---|
| 1. වස්කෝ ද ගාමා | A. යාපනය |
| 2. ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා | B. ඉන්දියාවේ කැලිකට් වරාය |
| 3. පරරාජසේකරම් රජු | C. රන්දෙණිවල සටන |
| 4. කොන්ස්තන්තිනු ද සා | D. සෙයිලන් |

1. B C A D  2. B D A C  3. D B A C  4. D B C A

33.

| X | Y |
|---|---|
| 1. ක්‍රි.ව. 1638 | A. අට්ටාපිටිය ගිවිසුම |
| 2. ක්‍රි.ව. 1634 | B. බයිබලය සිංහලට පරිවර්තනය |
| 3. ක්‍රි.ව. 1739 | C. ලන්දේසීන් හා කීර්ති ශ්‍රී රාජසිංහ රජු අතර ගැටුම් |
| 4. ක්‍රි.ව. 1766 | D. උඩරට ලන්දේසි ගිවිසුම |

1. B D A C  2. C A D B  3. D A C B  4. D A B C

34.

| X | Y |
|---|---|
| 1. පෞර රාජ්‍ය | A. නෙප්චූන් |
| 2. මුහුදට අධිපති දෙවියා | B. ස්පාටා |
| 3. ජලෝට් පීඩනය | C. සොපොක්ලීක්ස් |
| 4. ශෝකාන්ත නාට්‍ය | D. ආර්කිමිඩිස් |

1. B A D C  2. A B D C  3. D A C B  4. A C D B

35.

| X | Y |
|---|---|
| 1. චන්ද්‍රගුප්ත රජු | A. කාලිංගය අල්ලා ගැනීමෙන් මගධය ව්‍යාප්ත කරන ලදී. |
| 2. බින්දුසාර රජු | B. මගධ අධිරාජ්‍ය මහා ඇලෙක්සැන්ඩර්ගෙන් ආරක්ෂා කර ගැනීම. |
| 3. අශෝක රජු | C. නන්ද රාජවංශය පරදා මගධය අල්ලා ගැනීම. |
| 4. ධනනන්ද රජු | D. අමිත්‍රඝාත ලෙස හැඳින්වේ. |

1. B D A C  2. C A D B  3. D A C B  4. C D A B

- අංක 36 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය සලකුණු කරන්න.

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | චෝලයන් ක්‍රි.ව.993 දී රජරට කොල්ල කෑ අතර, තම පාලන මධ්‍යස්ථානය බවට පොලොන්නරුව පත් කර ගත්තේ ය. | ක්‍රි.ව.1017 දී මුන්මුඩි චෝළ මණ්ඩලම් ලෙස එකල හැඳින්වූ ලංකාව චෝල අධිරාජ්‍යයට යටත් විය. |
| 37. | ක්‍රි.ව.1619 දී පිලිප් ද ඔලිවේරා යටතේ ගිය පෘතුගීසි හමුදාවක් විසින් යාපනය යටත් කර ගත්තේ ය. | ක්‍රි.ව.1621 වන විටත් යාපනයේ බලය සම්පූර්ණයෙන් ම පෘතුගීසින්ට ලබා ගත නොහැකි විය. |
| 38. | ක්‍රි.ව.1638 දී දියෝගු ද මේලෝගේ නායකත්වයෙන් උඩරට ආක්‍රමණය කරන ලදී. | රන්දෙණිවල දී පෘතුගීසින් සමූල ඝාතනය විය. |
| 39. | ග්‍රීක ග්‍රන්ථ රචනා කළ අය අතර පුරෝගාමියා හෙරඩෝටස් ය. | ඉතිහාසයේ පියා ලෙස හැඳින්වෙන මොහු පර්සියානු ආක්‍රමණ පිළිබඳව කෘති සම්පාදනය කර ඇත. |
| 40. | බුරුමයේ ථේරවාද බුදු දහමේ පුනරුදය වෙනුවෙන් අනවරථ රජතුමා කිසිවක් නොකළේ ය. | අනවරථ රජුගේ අනුප්‍රාප්තිකයා ලෙස ක්‍යාන්සිත්ථ රජු බුරුමයේ ථේරවාද බුදුදහමේ පුනරුදය වෙනුවෙන් කටයුතු කළේ ය. |

* * *

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/ கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 07 | S | I, II |
|---|---|---|

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)
## 4 ශ්‍රේණිය
## (07) ඉතිහාසය - I, II

**සැලකිය යුතුයි :**

* පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. i. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

1. අනුරාධපුරය 2. මැණික් ගඟ 3. මාතර
4. මහනුවර 5. මහියංගනය 6. දඹකොළ පටුන

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 1 × 6 = 06)

ii. පහත A හා B රූප සටහන් අධ්‍යයනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) A රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ආ) එය ඉදි කළ රජතුමා කවුරුන් ද?

(ඉ) මෙය පිහිටි ඓතිහාසික නගරය කුමක් ද?



A රූපය

(ලකුණු 1 × 3 = 3)

iii. (අ) B රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ආ) එය නිම කොට ඇත්තේ කුමන රාජ පරම්පරාවකින් ද?

(ඉ) මෙය පිහිටා ඇති දූපත කුමක් ද?



B රූපය

(ලකුණු 1 × 3 = 3)

02. i. අතීතයේ දී පොලොන්නරුව හඳුන්වා ඇති නම් දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. පළමුවන විජයබාහු රජුගේ ආර්ථික සංවර්ධන සේවා හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පළමුවන විජයබාහු රජුගේ ආගමික සේවය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. i. පොලොන්නරු රාජ්‍යය පාලනය කළ රැජිනියන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

ii. රාජ්‍යත්වය තහවුරු කර ගැනීමේ දී නිශ්ශංකමල්ල රජුට මුහුණදීමට සිදු වූ අභියෝග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පොලොන්නරු රාජධානියේ පරිහානියට හා බිඳ වැටීමට බලපෑ හේතු සාධක කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. i. දඹදෙණිය රාජධානිය පාලනය කළ රජවරුන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

ii. කෝට්ටේ යුගයේ රචිත සන්දේශ කාව්‍ය හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. හයවන පරාක්‍රමබාහු රජතුමා සාහිත්‍ය හා අධ්‍යාපනයේ දියුණුවට කළ සේවාව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. i. ලංකාවට පැමිණි ප්‍රථම පෘතුගීසි ජාතිකයා සහ ඔහු පැමිණි ස්ථානය නම් කරන්න. (ලකුණු 02)

ii. පෘතුගීසින්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පෘතුගීසි ආගමනයෙන් ඇති වූ සමාජ හා සංස්කෘතික බලපෑම කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. i. ලන්දේසීන් ලංකාවට පැමිණීමේ අරමුණු දෙකක් දක්වන්න. (ලකුණු 02)

ii. 1638 උඩරට ලන්දේසි ගිවිසුමේ මූලික කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ලන්දේසීන්ගේ පැමිණීම නිසා ඇති වූ ආගමික බලපෑම් පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06)

07. i. ග්‍රීක නාට්‍ය කලාවේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. ග්‍රීසියේ විවිධ අංශවලට අධිපති දෙවිවරුන් සිව් දෙනෙකු දක්වන්න. (ලකුණු 04)

iii. මෞර්ය යුගයේ පරිහානියට හා බිඳ වැටීමට තුඩු දුන් හේතු සාධක කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

08. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක්** පිළිබඳ ඓතිහාසික තොරතුරු දක්වන්න.

i. රෝම අධිරාජ්‍යයේ පිරිහීම හා බිඳ වැටීම

ii. බුරුමය හා ලංකාව අතර පැවති සබඳතා

iii. ද්වාරවතී ශිෂ්ටාචාරය

iv. සෙන් බුදු දහම

(ලකුණු 6 × 2 = 12)

* * *

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/ கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 07 | S | I, II |
|---|---|---|

**මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)**

**4 ශ්‍රේණිය**

**(07) ඉතිහාසය - I, II**

**සැලකිය යුතුයි :**

* දෙවන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 01 (I) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිත කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මෙය ඔබේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.

